**ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන් , වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය හා අනුරූප වන බවට.

(ආ) මෙම වාර්තාවේ 1.6.2 (ආ) ඡේදයේ නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකළ නිර්දේශය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී නිවැරදි කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) භාණ්ඩාගාර අවසන් වාර්තාව ප්‍රකාරව රජයේ නිලධාරීන්ට අදාළ අත්තිකාරම් ගිණුම් ලැබීම් රු.57,717,141 වුවද රු.30,750 අඩුකර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.57,686,391 ලෙස පෙන්වා තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය පිළියෙල කිරීමට ප්‍රථම භාණ්ඩාගාර මුද්‍රිත හා දෙපාර්තමේන්තු ලෙජර් සංසන්දනය කළ යුතු වීම. | මෙය අදාළ මුදල Sub – 02 155011 ට ගොනු කරන ලද රු.30,750.00 ක් හරස් සටහන් මුදලකි. මෙය අතපසුවීමකින් අනෙකුත් අත්තිකාරම් ගිණුමේ සටහන් කර අග්‍රිම මුදල නිවැරදි කිරීමේ ප්‍රකාශයේ නිවැරදි කොට ඇත. |
| (ආ) ඒ.සී.ඒ.5 ආකෘතිය ප්‍රකාරව සමාලෝචනයට අදාළ රජයේ නිලධාරීන්ට අදාළ අත්තිකාරම් දීමනා රු.73,365,521 ලෙස පෙන්වා තිබුණු නමුත් එය රු.11,250 අඩුකර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.73,354,271 ලෙස පෙන්වා තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය පිළියෙල කිරීමට ප්‍රථම ඒ.සී.ඒ.5, භාණ්ඩාගාර මුද්‍රිත හා ලෙජර් සැසඳීම් සිදුකළ යුතු වීම. | මෙය අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 194011 සඳහා බැර කළ යුතු මුදල 27011 වෙත බැර කර ඇත. මෙය නිවැරදි කිරීම සඳහා 2019.12.31 දින G 122 මඟින් ඉදිරිපත් කළ ද එය භාණ්ඩාගාරය විසින් නිවැරදි කර නොතිබුණි. අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2020 ජුනි මස සාරාංශය මඟින් නිවැරදි කර ඇත. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අවස්ථා 21 ක් සඳහා වගකීම් වටිනාකම රු.1,437,911 ක් ලෙස භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන තුල දක්වා තිබුණ ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල එම ශේෂය පෙන්නුම් කර නොතිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමට ප්‍රථම භාණ්ඩාගාර මුද්‍රිත හා දෙපාර්තමේන්තු ලෙජර් සංසන්දනය කළ යුතු වීම. | 2019.12.31 දිනයේදී ශීර්ෂ අංක 270 යටතේ ගෙවිය යුතු වන වගකීම් කිසිවක් සත්‍ය වශයෙන් නොතිබුණි. නමුත් උප කාර්යාල කිහිපයක් තමාට වගකීම් ලෙස පෙන්වා දී තිබූ වගකීම් සඳහා 2019.12.31 දිනම හෝ එම දිනට පෙරම අදාල ගෙවීම් සිදුකර වගකීම් සියල්ලම විසඳා ඇතත්, ඒවා නිසි පරිදි ඇතුලත් (Web upload) නොකළ හේතුවෙන්, System ඒවා විසඳා නොවූ වගකීම් වශයෙන් දක්වා ඇත. උප කාර්යාලයන් මින් පසු එම අවස්ථාවේදීම ඇතුලත් (Web upload) කිරීම සිදුකළ යුතු බවට උපදෙස් ලබා දී ඇත. |

| | | |
|---|---|---|
| (ආ) 2018 වර්ෂය තුල වත්කම් අපහරණයක් හෝ විනාශ කිරීමක් හෝ සිදුකර නොතිබුණ ද මූල්‍ය ප්‍රකාශනයෙහි (ඒසීඒ 6) රු.26,316,881 ක් වටිනා වත්කම් විකුණුම් වශයෙන් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ද එය නිවැරදි කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අදාල ගනුදෙනුවේ ස්වභාවය අනුව වාර්තා කළ යුතු වීම. | යම්කිසි වත්කමක් පරිගණකයට (Cigass) ඇතුළත් කිරීමේදී යම් වැරැද්දක් සිදුවුවහොත් එය නිවැරදි කිරීම සඳහා වැඩසටහන තුල අලෙවියක් හෝ විනාශ කිරීමක් ලෙස සඳහන් කිරීමට සිදුවේ. ඇත්ත වශයෙන්ම එය Cigass වැඩසටහනේ පවතින අඩුපාඩුවක් වේ. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**
-----------------------------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------------- |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1647(ඉ) අනුව වාහන ලැයිස්තුගත ලේඛනයක් පවත්වාගත යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ කටයුතු කර නොතිබුණි. | වාහන ලැයිස්තුගත ලේඛනයක් පවත්වාගත යුතුය. | නිවැරදිව සකස් කර අවසන් කර ඇත. |

**1.6.4 ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතික වීම්**
-------------------------------------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------------- |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී හා ගණන් දීමේ නිලධාරියා සහතික කළ යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කලට සමාලෝචනය කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු වුවද එම සමාලෝචනයන් ලිඛිතව එහි පිටපතක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුව තිබුණත් එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මුදල් පාලනය සිදුකිරීම සඳහා අභ්‍යන්තර පාලනයේ එක් ප්‍රධාන අංගයක් ලෙස අභ්‍යන්තර විගණන අංශයක් අප දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටුවා එමගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්‍රියාත්මකව ඇති මුදල් පාලන කටයුතු කාලෙන් කාලයට පරීක්ෂා කර බලා එම වාර්තාවල පිටපත් විගණකාධිපතිගේ දිස්ත්‍රික් කාර්යාලය අම්පාර, අධ්‍යක්ෂ ජනරාල් විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුව, ප්‍රධාන ගණකාධිකාරී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක යන |

| | | | |
|---|---|---|---|
| | | | අයට කාලෙන් කාලෙට යවනු ලැබේ. මෙම පරීක්ෂණ කටයුතු අප විසින් සකසන ලද විගණන සැලසුමට අනුව සිදුකරන ලද විගණන පරීක්ෂණ වැඩසටහන්වලට අනුව සිදුකරනු ලැබේ. මෙහිදී අවදානම් සහිත කටුයතු නැවත පරීක්ෂා කර බැලීම පිළිබඳව අවධානය යොමුකරන අතර ඉදිරියේදී මෙලෙස සිදුවන නැවත පරීක්ෂණ ක්‍රමය හා සම්බන්ධව ඔබ දැනුවත් කරන බවට කාරුණිකව දැනුම් දෙමි. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) 1.4 වගන්තිය xii පරිච්ඡේදය | විදේශ නිවාඩු සඳහා අයදුම්පත නිවාඩු ආරම්භ කරන දිනට මාස 03කට නොඅඩු කාලයට පෙර ඉදිරිපත් කළ යුතු නමුත් අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන නිලධාරියෙකු විදේශ නිවාඩු යාමට දින 14ක් ඇතුළත 2019 නොවැම්බර් මාසයේ අයදුම්කර ඇත. නමුත් නිවාඩු සඳහා අනුමැතිය ජනවාරි 23 වන දින දක්වා ලැබී නැත. | අදාල නීති, රීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී III කේ.එම්.ෆාතිමා ජාසියා මිය විදේශගත වීම සඳහා නිවාඩු අයදුම් කර ඇති අතර 2019.11.11 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. සේවය තහවුරු කිරීමේ ලිපිය වැනි අඩුපාඩු හේතුවෙන් අයදුම්පත නැවත ආපසු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී ඇත. සියළුම ලේඛන සම්පූර්ණ කර 2020.02.24 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ii) 23.18 වගන්තිය xii පරිච්ඡේදය | රජයේ නිලධාරියෙකු දිවයිනෙන් බැහැරව ගත කරන නිවාඩු සම්බන්ධව වාර්තාවක් සකස් කර දෙපාර්තමේන්තු ප්‍රධානියා මාසිකව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නැත. | - එම - | දිවයිනේ සිට රාජ්‍ය නිලධාරීන් ගත කරන නිවාඩු පිළිබඳ වාර්තාව විගණකාධිපති වෙත යැවීමට කටයුතු කරන බව. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාද ජනරජයේ මුදල් රෙගුලාසි<br>--------------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 168(2) | රිසිට්පත් ආකෘති පොදු 172 හි ලබා දෙන විට දෙපැති ඇති කාබන් කඩදාසි භාවිතා කළ යුතු නමුත් දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම ක්‍රියාවලිය භාවිතා කර නැත. | අදාල නීති, රීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | රිසිට්පත් ආකෘති පොදු 172 හි ලබා දෙන විට දෙපැති ඇති කාබන් කොළ භාවිතා කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රමය මේ වන විට අනුගමනය කරගෙන යනු ලබයි. |
| (ii) මුදල් රෙගුලාසි 177(1) | රැස්කරන රජයේ මුදල් දිනපතා හෝ හැකි ඉක්මනින් ගෙවිය යුතු බව සඳහන් කර තිබුණද දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරීන් විසින් මාස 07ක් ප්‍රමාද කර එම මුදල් ගෙවා තිබුණි. | - එම - | අදාළ ග්‍රාම නිලධාරීන් නොගෙවා තිබූ මුදල් ගෙවා අවසන් කර ඇති අතර (අදාල රිසිට්පත් ඇමුණුම 03) ඉදිරියේදී මෙවන් අතපසුවීම් සිදු නොකිරීමට අදාළ නිලධාරීන්ට අවවාද කිරීම් සිදුකර ලිපි නිකුත් කර ඇත. |
| (iii) මුදල් රෙගුලාසි 210(1) | වට්ටම් ලබාගත යුතු විටදී ඒවා ලබා ගැනීමට කල් ඇතුව ගෙවීම් කළ යුතු බවට සඳහන් කර තිබුණද අදාළ කාලය තුල ජල බිල්පත් හිඟය ගෙවීම් නොකිරීම නිසා සායින්දමරුදු, සම්මන්තුරේ, අක්කරපත්තු සහ අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට වට්ටම් මුදල් ලබා ගැනීමට නොහැකිව තිබුණි | - එම - | නියමිත කාලසීමාව තුල ගෙවීම් කිරීම සිදුකල යුතු බවට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති අතර නියමිත කාලය තුල ගෙවීම් නොකර නොලැබෙන වට්ටම් අදාල විෂය භාර නිලධාරියාගෙන් අය කිරීමට කටයුතු කරන බවට අදාළ ප්‍රාදේශීය ලේකම්වරු දන්වා ඇත. විගණනයෙන් පසු නියමිත දිනට ගෙවීම් සිදු කර වට්ටමද හිමිකර ගත් බව ප්‍රාදේශීය ලේකම් සම්මන්තුර, අම්පාර, සායින්දමරුදු, අක්කරපත්තුව වාර්තා කර ඇත.<br>**සායින්දමරුදු** |

| | | | |
|---|---|---|---|
| | | | සායින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මහල් තුනකින් සමන්විත වේ. මෙම කාර්යාලයේ ජල සැපයුම පොළව යටත් ගොඩනැගිල්ල තුලත් ඇති බැවින් ජල කාන්දු වන බවත් පෙර දැනුවත් වී නොමැත. නමුත් විශාල ජල බිලක් ලැබීමෙන් පසු කරුණු සොයා ලැබීමේදී ජල කාන්දු වීමක් වාර්තා වී ඇත. ජල සම්පාදන මණ්ඩලය පරීක්ෂා කර බලා ජල කාන්දුවීම සකසා ඇත. මේ හේතුව මත ජල බිල්පත් ගෙවීමේ ප්‍රමාදයක් සිදුවූ බවත් ඉදිරියේදී මෙවන් අඩුපාඩු නොවීමටත් ක්‍රියාමාර්ග ගත් බවත් ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. |
| (ඇ)මුදල් අමාත්‍යාංශයේ අංක 4/2019 2019 ජුනි 17 වන දිනැති අයවැය චක්‍රලේඛය | විදුලි බිල්පත් වටිනාකමින් සියයට 5 ක් ඉතිරි කිරීමේ අරමුණින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණ ද අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විදුලි මීටර් 02 ක භාවිතය වැඩි වී තිබුණි. | අදාල නීති, රීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. | අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාවේ වායුසමීකරණ යන්ත්‍ර දිගු කාලයක් තිස්සේ අක්‍රීය වී තිබීම හේතුවෙන් අලුත්වැඩියාවන් සිදුකර ඇත. අදාළ කාලය තුළ නවක අභ්‍යාසලාභී උපාධිධාරීන් සඳහා කාර්යාලය තුල ඉඩ පහසුකම් නොමැති වීමෙන් ඔවුන් හට රැස්වීම් ශාලාව තුල පහසුකම් සැපයීමට සිදු වූ බැවින් විදුලි බිල වැඩි වී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය
-----------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය
--------------------------

| විගණන නිරීක්ෂණය<br>--------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------ |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාසික අග්‍රිම සැලසුම් කිරීම, ඉල්ලුම් කිරීම හා ලැබුණු අග්‍රිම යනාදිය සම්බන්ධව විශ්ලේෂණයේ දී සමාලෝචන වර්ෂයේ රු.මිලියන 7,903 ක් ඉල්ලීම් කර තිබුණ ද රු.මිලියන 2,431 ක් අඩු කර රු.මිලියන 5,472 ක් පමණක් ලබා දී තිබුණි. | ඉල්ලුම් කරන ලද අග්‍රිම සම්පූර්ණයෙන් ලබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මෙම කාර්යාලයට අවශ්‍ය මාසික අග්‍රිම සැලසුම් කිරීම, ඉල්ලුම් කිරීම සිදු කරනු ලබන අතර අක්මුදල් ලබා දීම තීරණය කරනු ලබනුයේ මුදල් අමාත්‍යාංශය විසිනි. වසර තුල ලබා දීමට නොහැකි වුවහොත් අතැති බිලපත් වශයෙන් සලකා ඉදිරි වර්ෂයේදී අක්මුදල් ලබා දීම සිදු කරනු ලබයි. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.4,050,000 ක් ග්‍රීන් ක්ලබ් (Green Clubs) වැඩසටහන සඳහා අනුමත කර තිබුණි. නමුත් ලැබුණු මූල්‍ය ප්‍රතිපාදනයෙන් රු.2,675,592 පමණක් අදාළ අරමුණ සඳහා වියදම් කර තිබුණි. | පරිපූරක ඇස්තමේන්තු යටතේ අනුමත වී ඇති සම්පූර්ණ ප්‍රතිපාදන අදාල වැඩසටහන සඳහා භාවිතා කළ යුතු වීම. | මුදල් අමාත්‍යාංශ ලේකම් අංක BD/GPS/115/09/65/HA-2019 හා 2019.08.19 දිනැති ලිපිය මඟින් ප්‍රතිපාදන නිදහස් කර ඇත. 2019.09.09 දින ව්‍යාපෘති යෝජනාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇති අතර වරින් වර දූරකථනය හරහා ද සම්බන්ධ වී ඇත. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා හා මේ සම්බන්ධව සාකච්ඡා කළ විට එවකට පැවති දේශපාලන බලපෑම් හේතුකොට ගෙන තාවකාලිකව කල් දමා ඇත. |

## 2.3 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක අධිකරණ දඩ මුදල් හා මුද්දර ගාස්තු වටිනාකම වූ රු.මිලියන 10.5 ක් අදාළ අමාත්‍යාංශවලට හෝ දෙපාර්තමේන්තුවලට යොමු නොකර සමාලෝචිත වර්ෂ අවසානයේ තැන්පත් ගිණුමේ තිබුණි. | වෙනත් අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු වලට අදාල රැස්කරන ලද දඩ මුදල් හා මුද්දර ගාස්තු අදාල ආයතන වෙත හැකි ඉක්මණින් යැවිය යුතු වීම. | අක්මුදල් හිඟකම හේතුවෙන් 2019 වර්ෂයේ දී ගෙවීම් අවසන් කිරීමට නොහැකි වූ අතර මෙම වර්ෂයේදී ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත මුදල් ගෙවා අවසන් කර ඇත. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධනය සම්බන්ධ සැලසුම් කිරීමට හා අනාවරණය වූ වෙනත් සැලසුම් කිරීමේ ඌනතාවයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද 2017 පෙබරවාරි 17 වන දින අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව එහි ඇතුලත් කළ යුතු පහත සඳහන් කරුණු ඇතුලත් කර නොතිබුණි. | | |

| | | |
|---|---|---|
| (අ) අනුමත සේවක සංඛ්‍යා හා දැනට ඇති සේවක සංඛ්‍යා විස්තර. | වක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේදී අදාල සියලු කරුණු ඇතුලත් කළ යුතු වීම. | ඉදිරි වර්ෂයේ දී සියළුම තොරතුරු ඇතුළත් අංග සම්පූර්ණ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (ආ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා අත්තිකාරම් අවශ්‍යතා සැලැස්ම (Imprest Requitments plan) | - එම - | - එම - |
| (ඇ) සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම.(Annual Procurement Plan) | - එම - | - එම - |
| (ඈ) අභ්‍යන්තර විගණන සැලැස්ම.(Internal Audit Plan) | - එම - | - එම - |

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ මුදල් ප්‍රතිපාදන යටතේ කල්මුණේ ප්‍රාදේශීය කොට්ඨාසයේ ඇති කාර්මෙල් පට්ටුමා ජාතික පාසලට ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 10 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර කොන්ත්‍රාත්කරුවෙකු සමඟ 2019 නොවැම්බර් 11 වන දින ගිවිසුම් ගත වී 2019 දෙසැම්බර් 25 අවසන් කිරීමට එකඟ වී තිබුණි. නමුත් 2019 දෙසැම්බර් 31 දක්වා වැඩ කිසිවක් ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතියක් සඳහා නියමිත කාල පරිච්ඡේදය තුල වැඩ අවසන් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | කාර්මෙල් පට්ටුමා ජාතික පාසලේ ගෘහස්ථාගාරය ඉදිකිරීම සඳහා 2019 නොවැම්බර් 11 දින ගිවිසුම් ගත වී ඇති අතර පැවති කාලගුණික තත්ත්වය හේතුවෙන් වැඩ අවසන් කිරීමට නියමිත දින වන 2019 දෙසැම්බර් 25 දිනට වැඩ අවසන් කිරීමට නොහැකි වී ඇත. 2019 අවිච්ඡේද වැඩ සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කළ බව ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. වරින් වර මුදල් අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති ආරම්භ කිරීම ප්‍රමාද කරන ලෙස දැන්වීමක් මෙයට හේතු වී ඇත. |
| (ආ) දිගුකාලීන අවතැන් වූවන් නැවත පදිංචි කිරීම හා සමූපකාර සංවර්ධන සඳහා අමාත්‍යාංශ යටතේ ලබා දෙන ලද රු.මිලියන 13 ක් වටිනා වැඩ 12 ක් හා රු.මිලියන 3.5 ක් වටිනා වැඩ 05 ක් අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් | - එම - | අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාළ ව්‍යාපෘති 05 න් 03 ක් සඳහා මිල ගණන් කැඳවීමේ තීරණය 2019.12.22, 26 දිනයන් වුවත් 2019.11.21 දිනට පසුව කිසිදු |

| | | |
|---|---|---|
| කාර්යාලය විසින් විගණන දිනය වන 2020 ජනවාරි 23 වන තෙක් ආරම්භ කර නොතිබුණි. | | ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොකරන ලෙසට මුදල් අමාත්‍යාංශ අංක BD/GPS/155/09/01/HA-2019 හා 2019.11.20 දිනැති ලිපිය අනුව දන්වා ඇත. ව්‍යාපෘති 03 ක් ආරම්භ කර ඇති අතර ව්‍යාපෘති 02 ක වැඩ ආරම්භ කර නොමැත. |
| (ඇ) නගර සැලසුම් ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘතිය යටතේ **SACOSAN** වැසිකිලි ඉදිකිරීම් වැඩසටහන සඳහා පුද්ගලයින් 28 දෙනෙකුට වැසිකිලි ඉදිකිරීම සඳහා රු.මිලියන 1.4 ක මුදල අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට 2019 වර්ෂයේ වෙන් කර තිබුණි. නමුත් රු.500,000 වටිනාකමින් යුත් පුද්ගලයින් 10 දෙනෙකුගේ වැසිකිලි පමණක් අවසන් කර තිබුණු අතර රු.900,000 ක වටිනාකමින් යුත් ඉතිරි 18 දෙනාට අදාළ වැසිකිලි ඉදිකර නොතිබුණි. | - එම - | <u>අවලංගු කරන ලද වැසිකිළි</u> වැසිකිළි අත්‍යාවශ්‍යව තිබූ ප්‍රතිලාභීන් 28 ක් තෝරා ගන්නා ලදී. එයින් ප්‍රතිලාභීන් 18 දෙනෙක් වැසිකිළි ඉදිකිරීම සම්බන්ධව අමාත්‍යාංශ විසින් එවන ලද සිතියමට අනුව වැසිකිළි ඉදිකිරීමට නොහැකි බවත් ප්‍රමාණවත් ආදායම් මාර්ගයක් නොමැති හේතුවෙන් වැඩිපුර දායකත්වයක් ලබා දීමට නොහැකි බවට ඔවුන් ලිඛිතව දන්වා තිබූ බැවින් ප්‍රතිලාභීන් 18 දෙනෙකුගේ නම් ප්‍රතික්ෂේප කරන ලදී. |
| (ඈ) දේවාලය ප්‍රතිසංස්කරණය, ක්‍රීඩා උපකරණ, සති පොළ, කොන්ක්‍රීට් පාර ප්‍රතිසංස්කරණය වැනි විවිධ වැඩසටහන් සඳහා RIDP, ONUR, Task Force on Resettlement of Protected IDPS, Lagoon Conservation and Development, Let's together for nation හා DCB යන ව්‍යාපෘති යටතේ මුදල් ප්‍රතිපාදන මඟින් රු.170,631,000 ක සමස්ත වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15කට අනුමත කර තිබුණ ද ඉඩම් ගැටළු, වැරදි තේරීම් හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලැබීම වැනි හේතූන් මත සමාලෝචන වර්ෂයේ දී අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | - එම - | නැවත පදිංචි කිරීම් අමාත්‍යාංශ හා විමධ්‍යගත මුදල් ප්‍රතිපාදන මඟින් රු.110,631.00 ක සමස්ථ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක විවිධ හේතූන් නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබූ බව සඳහන්ව තිබුණ ද නැවත පදිංචි කිරීම් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලද කිසිදු ව්‍යාපෘතියක් 2019 වර්ෂයේ දී නතර නොකරන ලද අතර එම වැඩසටහන අදාළ සියලු ව්‍යාපෘතීන් එම වර්ෂයේදී ක්‍රියාත්මක කර ඇත. විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ දෙහිඅත්තකණ්ඩිය, කල්මුණ (මු), සම්මන්තුර, තිරුක්කෝවිල් හා පොතුවිල් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 තුළ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලද රු.මිලියන 1.14 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 09 පමණක් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. |

| | | |
|---|---|---|
| (ඉ) අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අල්පෙස් වැඩිහිටි සංවිධානයට පේෂ කර්මාන්ත වැඩ සඳහා උපකරණ මිලදී ගැනීමට රු.මිලියන 01 ක්, දිගු කාලයක අභ්‍යන්තර ස්ථාන මාරුවුවන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ වෙන් කර තිබුණි. කිසිදු ගොඩනැගිලි පහසුකමක් නොමැති මෙම සංවිධානයට පේෂ කර්මාන්ත උපකරණ 06 ක් ලබා දී තිබුණ ද ඒවායේ 02ක් පමණක් ග්‍රාම නිලධාරි සමිති ගොඩනැගිල්ලේ කොටසක භාවිතා කරන අතර ඉතිරි උපකරණ 04 භාවිතා කිරීමට ඉඩ පහසුකම් නොමැති වීම නිසා ඒවා භාවිතා නොකර අඩුක්කර තබා තිබුණි.එම නිසා ඒවායින් අපේක්ෂිත සුභසාධන ලබාගෙන නොතිබුණි. | අදාල උපකරණ මිලදී ගැනීමට පෙර තෝරාගත් ස්ථානයන්ගේ ඒ සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබේද යන්න සලකා බැලිය යුතු වීම. | අල්පෙසිරා පෞෂ්ඨ සංවිධානයට හස්ත කර්මාන්තය සඳහා අක්කරපත්තු 14 ග්‍රාම සංවර්ධන සමිතියේ ගොඩනැගිල්ල පරිහරණය කිරීමට එම සමිතියේ එකගතාවය මත හස්ත කර්මාන්ත උපකරණ ලබා දෙන ලදී. සමිතිය විසින් ගොඩනැගිල්ලේ එක් කොටසක් පරිහරණය කිරීම නිසා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති තත්ත්වයක් ඇති වී තිබී ඇත. |

## 3.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | -------------------------------------- |
| (අ) ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සුභ සාධන අමාත්‍යාංශයේ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් 2019 ජූලි 30 වන දිනැති අංක NSE/DEV/02101 දරන ලිපිය මගින් නාවිතන්වෙලි හා කල්මුණේ දෙමළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා රු.3,999,000 ක වටිනාකමකින් යුත් චෙක්පත් ලබා දී 2019 ඔක්තෝබර් 30 වන දිනට පෙර වැඩිහිටියන්ට භාර දීමට එකඟ වී තිබුණි. එහෙත් 2019 දෙසැම්බර් 12 දින දක්වා මෙම ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | කිසියම් ව්‍යාපෘතියක් සඳහා නියමිත වූ කාල පරිච්ඡේදය තුල අවසන් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. | කල්මුණ වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ ගොඩනැගිලි වැඩ සම්පූර්ණයෙන් අවසන් කල පසු 2020 වසරේ දී ගෙවීම් කටයුතු සිදුකර ඇත.<br>නාවිදන්වෙලි මධ්‍යස්ථානය 2019.10.30 දිනට පෙර වැඩ අවසන් කිරීමට ගිවිසුම් ගත වී ඇත. නමුත් කාලය දීර්ඝ කරන ලෙස කරන ලද ඉල්ලීමට අනුව 2019.11.30 දින දක්වා දීර්ඝ කර ඇත. (අදාළ ලේඛන ඇමුණුම 8 ලෙස යා කර ඇත.) 2019.11.28 දින වැඩ අවසන් බව කොන්ත්‍රාත්කරු දැන්වූවත් සුළු කොටස් ඉතිරිවීම නිසා ඒවා නිම කිරීමෙන් අනතුරුව 2019.12.12 දිනට ගෙවීම් සිදුකල බව නාවිදන්වෙලි ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශ විසින් සම්මන්තුරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් පාසල් දෙකකට Smart Class Room ඉදිකිරිම සඳහා රු.මිලියන 06ක් ප්‍රතිපාදනය කර තිබුණි. සම්මන්තුරේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ 2019 දෙසැම්බර් 16 දින ලිපිය අනුව රු.3,860,000 වටිනාකමින් යුත් උපකරණ මිලදී ගත් බව සඳහන් කර මුදල් මුදල් ඉල්ලා තිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මෙම වියදම බැරකම් ලෙස ගිණුම් වල පෙන්වා තිබුණි.කෙසේ වුවද 2020 පෙබරවාරි 19 වන දින දක්වා උපකරණ මිලදී ගෙන අදාළ පාසල් වලට ලබා දී නොතිබුණි. | අදාල උපකරණ ලැබීමෙන් පසු පමණක් වියදම් හඳුනාගත යුතු වීම. | සියලුම කාර්යයන් අවසන් කර ගෙවීම් අවසන් කර ඇත. |

**3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජීවනෝපාය සංවර්ධන කුසලතා වර්ධන හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ග්‍රාම ශක්ති සංවර්ධන වැඩසටහන යටතේ 2018 වර්ෂයේ රු.මිලියන 60 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඉන් රු.59,999,700 ක මුදලක් 001-2-6-11-2-2202 වැය විෂයය යටතේ වියදම් ලෙස පෙන්වා තිබුණි. නමුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මඟින් තෝරාගනු ලැබූ ග්‍රාම ශක්ති ප්‍රජා සමිති 66 ක බැංකු ගිණුම්වල රු.49,948,900 ක් අදාළ අරමුණ සඳහා වියදම් නොකර 2018 වර්ෂය අවසානය වන විට ඉතිරිව තිබුණි. තවද 2019 වර්ෂයේදී පළමු අදියර සඳහා රු.මිලියන 66 ක් ද දෙවන අදියර සඳහා රු.මිලියන 64.4 ක් ද වෙන් කර තිබුණු අතර පිළිවෙලින් රු.මිලියන 53 ක් හා රු.මිලියන 20 ක් වියදම් ලෙස පෙන්වා තිබුණි. නමුත් ඉන් රු.54,756,118 ක මුදලක් වර්ෂ අවසානයේ අදාළ අරමුණට භාවිතා නොකර අදාළ ග්‍රාම ශක්ති (ප්‍රජා) ජනතා සමිති බැංකු ගිණුම්වල තැන්පත් ලෙස ඉතිරි වී තිබුණි. | ග්‍රාම ශක්ති ව්‍යාපෘතිය යටතේ ග්‍රාම ශක්ති ජනතා සමිති සඳහා ලබාදෙන මුදල් සම්පූර්ණයෙන් උපයෝජනය කළ හැකි පරිදි සුදුසු වැඩසටහන් හඳුනාගෙන අදාල සමිති සඳහා මහ පෙන්වීම් සිදුකළ යුතු වීම. | 2018 වර්ෂයේ ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපෘතිය යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන්කල ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති සියල්ලම 2018.12.31 දින වන විට අවසන් කර ඇත.<br>ක්ෂුද්‍ර මූල්‍ය ණය ලෙස සමිති සාමාජිකයින්ට චක්‍රීය ණය ලබාදීමට ප්‍රතිපාදන ලබා දී තිබුණ ද මෙම ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නිලධාරීන්ට අවශ්‍ය මූලික පුහුණුව ලබා දීමට අවශ්‍ය උපදෙස් හා ණය ලබා දීමට අවශ්‍ය පොත්පත් උපදෙස් ඒ වනවිටත් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබා දී නොතිබුණත් මේ හා සමගාමී වැඩසටහන්වල අත්දැකීම් යොදාගෙන වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.<br>එසේම ධාරිතා සංවර්ධන හා හැකියා වර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා පුහුණු සම්පත් දායකයින් දිස්ත්‍රික්කය තුළ නොසිටීම, එසේම ඔවුන් බැහැරින් ගෙන්වීමේ දී රජයේ අනුමත ගාස්තු මත කටයුතු කිරීමට පුහුණු |

| | | |
|---|---|---|
| | | සම්පත් දායකයින් එකඟ නොවීම නිසා පුහුණු වැඩසටහන් නිසි පරිදි පැවැත්වීමට නොහැකි වී ඇත. මේ හේතුව නිසා ඒ සඳහා වෙන්වී තිබුණු ප්‍රතිපාදන සම්පූර්ණයෙන් එම වර්ෂයේ දී නිදහස් කිරීමට නොහැකි වී ඇත.<br>2019 වර්ෂයේ පළමු අදියර යටතේ ලබාදුන් ප්‍රතිපාදන සඳහා අක්මුදල් ඉල්ලුම් කර වරින් වර ලැබුණු මුදල් සමිති ගිණුමේ තැන්පත් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මැතිවරණ කටයුතු ආරම්භ වීමත් සමඟ ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි වී ඇත. (අදාළ 2019.11.20 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍ර ලේඛයට අනුව).<br>දෙවන අදියරේ තෝරා ගනු ලැබූ ග්‍රාම ශක්ති සමිති සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරිමේ දී සිදු වූ ප්‍රමාදයක් හේතුවෙන් හා අක්මුදල් නොලැබීම යන හේතු නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව සැලසුම් අධ්‍යක්ෂවරයා වාර්තා කර ඇත. මෙම වැඩසටහන් මෙම වර්ෂය තුල දී සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කර සහකාර අධ්‍යක්ෂවරුන් හා සංවර්ධන නිලධාරීන් දැනුවත් කර ඔවුන්ට අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සම්මන්තුරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "සපූර්" සණස සමිතියට පසුගිය 2000 මාර්තු 23 වන දින රජයේ ඉඩම් පනත යටතේ ආදර්ශ ගොවිපළ සකස් කිරීම සඳහා දීර්ඝ කාලීන බදු (වසර 30) පදනම මත සෙන්නල් ග්‍රාමය 01 හි පිහිටා ඇති හෙක්ටයාර 0.847 පරිමිතියෙන් යුත් රජයේ ඉඩම ලබා දී තිබුණි. | දිගුකාලීන බදු ඔප්පු ලබාදීමේ දී අදාල අරමුණු වෙනුවෙන් භාවිතා කරනු ලබන්නේද යන්න සහතික කරගත යුතු අතර, එසේ ක්‍රියා නොකරන්නේ | මෙම ඉඩම්වලට අදාල බද්ධ අවලංගු කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය නොලැබුණු බැවින් සම්මන්තුර ප්‍රාදේශීය ලේකම්ට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි මට්ටමේ පවතින බව ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. එසේ වුවත් පළාත් ඉඩම් කොමසාරිස් මෙම බදු අවලංගු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම සඳහා ලේඛන ලබා දෙන ලෙස 2020.05.26 දිනැති EP/28/LB/Ls/Amp/Gen දරන |

| | | | |
|---|---|---|---|
| | එම ඉඩම අදාළ අරමුණට භාවිතා නොකර බොහෝ කැබැලිවලට වෙන්කර ඒවායේ සම්පූර්ණ කරන ලද නිවාස 22 ක් ද කොටසක් සම්පූර්ණ කරන ලද නිවාස 04 ක් ද අඩිතාලම දමන ලද ස්ථිර ගොඩනැගිලි 03ක් ද තිබෙන බව ග්‍රාම නිලධාරි හා ජනපද නිලධාරි විසින් 2011 ජූලි මස වාර්තා කර තිබුණි. එහෙත් මෙම ඉඩම නැවත ලබා ගැනිමට 2020 පෙබරවාරි 18 දක්වා පියවර ගෙන නොතිබුණි. | නම් එයට විරුද්ධව කඩිනම් පියවර ගත යුතු වීම. | ලිපිය මඟින් දන්වා ඇත. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>**(i)** ග්‍රාම නිලධාරී වාර්තාවන්<br>**(ii)** ඉඩමේ වර්තමාන තත්ත්වය පිළිබඳ ක්ෂේත්‍ර වාර්තාවන් ඉල්ලුම් කර ඇත. |
| (ආ) | සම්මන්තුරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝ කාලීන බදු පදනම මත හෙක්ටයාර 0.19 ඉඩම බදුකරුවන් දෙදෙනෙකුට ලබා දී තිබුණද ඒවාට අදාළ හිඟ මුදල වන රු.87,774 ක් අයකිරිමට අපොහොසත් වී ඇත. | නියමිත කාලයට අදාලව හිඟ බදු මුදල් අයකිරීමට පියවර ගත යුතු වීම. | සෙන්නෙලි ග්‍රාමය අංක 01 ඉඩමේ ආදර්ශ ගොවිපල සඳහා වූ ඉඩමෙන් රු.51,770.00 ක මුදලක් දැනට අයකර ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. එම ග්‍රාමය වෙළඳාම සඳහා බදු දී ඇති නමුත් මියගිය අයගේ බිරිඳ වන හාජරා ගෆූර් මියට අනුමැතිය පැවරීමට ක්‍රියාමාර්ග දැනට පළාත් ඉඩම් කොමසාරිස්වරයා පටන්ගෙන ඇත. එම අනුමැතිය ලැබුණු විගස අයකිරීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "දැයට කිරුළ 2013" සංවර්ධන ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කිරීමට ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති 05ක් ක්‍රියාත්මක කිරීමේදී රු.6,512,909 ක මුදලක් අවභාවිත කර ඇති බව වාර්තා වී තිබුණි. | අදාල ගැටලු සහිත තත්ත්වය පිළිබඳ දැනට සිදුවන විමර්ශන කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. | මෙම ව්‍යාපෘති සඳහා ගෙවීම් සිදුකිරීම දමන ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරීගේ වාර්තා මත දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එවකට සිටි නිලධාරීන් විසින් වරින් වර සිදුකර ඇත. එසේ වුවද, ව්‍යාපෘති නිම කිරීම සම්බන්ධව ගැටලු සහගත තත්ත්වයක් වාර්තා වීමෙන් අනතුරුව කරුණු සොයා බැලීම සිදුකරන ලදී. ඒ සඳහා මෙම කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරුවරයා වාර්තා ලබා ගන්නා ලදි. එම වාර්තා මින් පෙර ඔබ වෙත ඉදිරිපත් කර ඇත. එසේම පොලිස් විශේෂ අපරාධ විමර්ශන අංශය මඟින් මේ සම්බන්ධව විශේෂ විමර්ශනයක් සිදුකරන අතර, වැඩිදුර විමර්ෂන කටයුතු සඳහා අදාල ලිපිගොනු ඔවුන් භාරයට ගෙන ඇති බව කාරුණිකව දන්වමි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචන වර්ෂ අවසානයේ පැවති පුරප්පාඩු 266 සුදුසු පරිදි සම්පූර්ණ කිරීමට කටයුතු සිදුකර නොතිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා වූ සේවක පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වීම. | (අ), (ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සම්මත සේවක සංඛ්‍යාව හා දැනට සිටින සේවක සංඛ්‍යාව අනුව 2019.12.31 දිනට පුරප්පාඩු 266 ක් පැවතිය ද එම සංඛ්‍යාව සම්පූර්ණ කිරීම සඳහා නිලධාරීන් බඳවා ගැනීමට මා වෙත බලය පැවරී නොමැති බැවින් පවතින පුරප්පාඩු පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යංශය වෙත වරින් වර වාර්තා කර ඇති බව කාරුණිකව දන්වමි. තවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල දත්ත සෑම දෙසතියකට වරක් අමාත්‍යංශය විසින් හඳුන්වා දී ඇති මාර්ග ගත ක්‍රමය ඔස්සේ යාවත්කාලීන කරන බව වැඩිදුරටත් දන්වමි. 2019.12.31 දිනට සම්මත සේවක සංඛ්‍යාව හා දැනට සිටින සේවක සංඛ්‍යාව ඇමුණුම 10 වශයෙන් යා කර ඉදිරිපත් කරමි. |
| (ආ) දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරි, අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර්, සංවර්ධන නිලධාරි හා කළමනාකරණ නිලධාරි වැනි වැදගත් තනතුරුවල පුරප්පාඩු 27ක් සමාලෝචන වර්ෂයේ අවසානයට පැවතුනි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවතින අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අදාල පියවර ගත යුතු වීම. | |